# කැලණිය අධ්‍යාපන කලාපය
## දෙවන වාර පරීක්ෂණය - 2016
## සිංහල භාෂාව හා සාහිත්‍යය

7 ශ්‍රේණිය | කාලය පැය 02 යි.

නම/අංකය: ______________________________.

### I පත්‍රය

- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 40 කි.
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

- පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන ප්‍රකාශය තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ශ්‍රී ලංකාවේ වතු කම්කරුවන්ගෙන් බහුතරයක් සංක්‍රමණික ජනකොටස්වලින් සමන්විත ය.
1. මෙරටින් බැහැර ගිය
2. මෙරට ඉපදුණු
3. මෙරටට පැමිණ පදිංචි
4. මෙරට සංචාරයට පැමිණි

(02) වර්තමාන ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන මාර්ගවලින් එකක් ලෙස ඇඟලුම් කර්මාන්තය සැලකේ.
1. මෙරටින් පිටරටට යවන
2. පිටරටින් මෙරටට ගෙන්වන
3. මෙරට සඳහා නිෂ්පාදනය වන
4. මෙරට වෙළෙඳ පොළට යවන

(03) මෙම සහස්‍රකය මුහුණ දෙන ප්‍රධාන ගැටලුව බවට පත්ව ඇත්තේ ස්වභාවික ව්‍යසනයන් ය.
1. සියයකින් සමන්විත ඒකකය.
2. දහයකින් සමන්විත ඒකකය.
3. දහසකින් සමන්විත ඒකකය.
4. දසදහසකින් සමන්විත ඒකකය.

- පහත මුලින් දී ඇති පදයට විරුද්ධ පදය වරහනින් තෝරා යටින් ඉරක් අඳින්න.

(04) දුර්ගුණ - (අගුණ, නුගුණ, යහගුණ, අවගුණ)
(05) සුගන්ධය - (සුවඳ, සුගඳ, දුර්ගන්ධය, සුහඳ)

- පහත මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථය නොදෙන පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(06) අධම - (උත්තම, අධර්මිෂ්ඨ, උතුම්, ශ්‍රේෂ්ඨ)
(07) අප්‍රසිද්ධ - (ප්‍රසිද්ධ, පසිඳු, අප්‍රකට, පරසිඳු)

- හිස්තැනට සුදුසු පදය වරහනින් තෝරන්න.

(08) ඔහු එහි තිබූ ____________ තුළට වැටෙන්නට ගියේ ____________ක් පමණ පරතරයකින් ගමන් කරන්නට යාමෙනි. (අඟල/අගල)
(09) අම්බලමේ සිටි ____________ මිනිසා ____________ උදෑසන එහි දක්නට නොවීය. (අඳ/අද)
(10) හිමිදිරියේ ම පිය මනින ____________ රුව දුටු ____________ ගෙදර නැන්දා හීලට ආරාධනා කළාය. (මහන/මහණ)

- හිස්තැනට සුදුසු පදය වරහනින් තෝරා ලියන්න.

(11) සිංහලයිනි! ________________ බුද්ධ ගයාව බේරාගනිව්.!

(12) අත්තම්මා මල් ________________ බුදුන් වැන්දා ය.

(13) අම්මා නංගී සමඟ පොළට ________________.

(පුදා, නැගිටිව්, ගියා ය, පැමිණෙන්න, යති)

- පහත වාක්‍යවල හිස්තැනට ගැළපෙන උපසර්ග පදය යොදන්න.

(14) නිදහස් ____________ ජාතියක් ගොඩ නඟමු.

(15) පන්සිල් රකින සමාජයක් ________________ දුරු කළ යුතු ය.

(වහල්, දුසිරිත්, පරසිරිත්, නිවහල්, සුචරිත)

- පහත ඇති ප්‍රකාශවලට ගැළපෙන තනිපදය සොයා යා කරන්න.

| | අ | ආ |
|---|---|---|
| (16) | රනින් කරන ලද | කුඹල්කරු |
| (17) | අනුන් ගැන සිතන | ශතකය |
| (18) | මැටි බඳුන් සාදන්නා | ජනශූන්‍ය |
| (19) | වසර සියය | පරාර්ථකාමී |
| (20) | ජනයා අඩු | ස්වර්ණමය |

(ලකුණු 20 x 2 = 40 යි)

## II පත්‍රය

- 1 සහ 2 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න <u>පහකට</u> පමණක් පිළිතුරු සපයන්න.

(01) පන්ති කාමරයේ කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ඔබ සියලු දෙනාගේ ම නිර්මාණ ඇතුළත් කොට නිර්මාණය කරන ලද පන්ති සඟරාව ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබ නිර්මාණය කරන ලද සඟරාවට යොදන ලද නම කුමක් ද?
(ලකුණු 02)

(ii) සඟරාව නිර්මාණය කිරීමේ දී ගුරුවරයා ඔබට දුන් උපදෙස් 2 ක් ලියන්න.
(ලකුණු 02)

(iii) ඔබේ සඟරාවට ඇතුළත් කරන ලද නිර්මාණ වර්ග 2 ක් ලියන්න.
(ලකුණු 02)

(iv) සඟරාව නිර්මාණය කිරීමේ දී ඔබට මතු වූ ගැටලු 2 ක් ලියන්න.
(ලකුණු 04)

(v) සඟරාව සැකසීම සඳහා ඔබ යොදා ගත් උපක්‍රම 2 ක් ලියන්න.
(ලකුණු 04)

(ලකුණු 14)

(02) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200 ක පමණ රචනයක් ලියන්න.

(i) විද්‍යුත් අපද්‍රව්‍යවලින් සිදුවන හානි අවම කරමු.

(ii) ගං වතුරට මැදි වී.

(iii) දහම් පාසල් අධ්‍යාපනය ධාර්මිෂ්ඨ සමාජයකට මං සලසයි.

(iv) මා කියවූ රසවත් ම පොත.

(ලකුණු 16)

(03) ඔබ පාසලේ පැවැත්වීමට යෝජිත උත්සවයක් වෙනුවෙන් සහභාගි කර ගැනීමට අපේක්ෂා කරන ආරාධිතයින් වෙත යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.
(ලකුණු 10)

(04) පහත පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1.
බණ නම් නිබොරුය මුනිවරයන් ගේ
කය නම් නොතිරය අදහා ගන්නේ
පණ නම් තණ අග පිණි බිඳු වැන්නේ
පින නම් නොපමාව ම කර ගන්නේ

2.
කරන කලට පව් මීරිය මී සේ
විඳින කලට දුක් දැඩි වෙයි නිති සේ
ඇඳින එපව් දුරලන උපදේ සේ
නුදුන මැනවි තුන් දොර අවකා සේ

1. මෙම කවියෙන් නිබොරු දෙයක් ලෙසට කවියා ඉදිරිපත් කරන්නේ කුමන දෙයක් ද?
2. නොපමාව කර ගත යුතු වන්නේ කුමක් ද?
3. මෙම පද්‍යයෙන් කවියා දෙන උපදේශය කුමක් ද?
4. මෙම පද්‍ය පංතියේ ඇති උපමා 2 ක් උපුටා දක්වන්න.
5. පහත වචන 2 අර්ථවත් වන කවියේ ඇති පද සොයා ලියන්න.
   1. ශරීරය ______________ 2. සත්‍යය ______________.

(ලකුණු 2 x 5 = 10 යි)

(05) පහත සඳහන් ඡේදය නිවැරදි ව පද බෙදා නැවත ලියන්න. පහත සඳහන් විරාම ලකුණු ද කොටු තුළ යොදන්න.

රට දැය පිළිබඳ ව දරුවන් තුළ සෙනෙහස□භක්තිය□අභිමානය මෙන් ම උද්‍යෝගය ද දක්විය හැකි ප්‍රබල මාධ්‍යයකි කවිය හා ගීතය□මව්බිමේ සොඳුරු බව ද කවි ඇසින් දුටු කවියෝ බොහෝ ය. භක්ති ප්‍රේමයෙන් රැකගත යුතු අප මාතෘභූමිය වර්ණනා කරන ලද ගීත □දේශාභිමානී ගීත□ලෙස හැඳින්වේ□අප මව්බිම පිළිබඳ ව නිර්මාණය වූ ගීත සාහිත්‍යයේ ඇති එවන් නිර්මාණ කොතරම් රසවත් ද□

1. ? 2. " " 3. , 4. .

(ලකුණු 10 යි)

(06) ඔබ උගත් පාඩමක් ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| පාඨය | පාඩමේ නම | කෘතියේ නම | යුගය | කවුරුන් විසින් | කාහට |
|---|---|---|---|---|---|
| ශිල්ප උගන්නට ආමි | | | | | |

(07) පහත කවි දෙකෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

i.
මගෙ තුන් මැසි දියණියගේ
රසවත් සිහිනය දිගේ
______________________,
______________________.

ii.
මහනෙල් සුවඳ මය
______________________,
දෙකට එක දිය ම ය
______________________.

(ලකුණු 5 x 2 = 10 යි)
(මුළු ලකුණු 60 යි)